සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණය - I

**නම/විභාග අංකය :-- ..........................................................................** **කාලය : පැය 01 යි.**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ (X) ලකුණකින් සටහන් කරන්න.**

(1) $A_2$ කඩදාසියක සම්මත දිග, පළල වන්නේ මිලිමීටර්,
(1) 1188 x 841 (2) 841 x 594 (3) 594 x 420 (4) 420 x 297

(2) පාරාවෝ රජදරුවන්ට අයත් ලෝ ප්‍රකට නිර්මාණය වන්නේ,
(1) ලෝවාමහාපාය (2) සීගිරිය (3) පිරමීඩ (4) චීන මහා ප්‍රාකාරය

(3) ලොව උසම ගොඩනැගිල්ල ලෙස සැලකෙන්නේ,
(1) අයිපල් කුළුණ (2) කලිෆර් ගොඩනැගිල්ල
(3) නෙළුම් කුළුණ (4) ටජ් මහල

(4) යාන්ත්‍රික ගුණයක් වන්නේ,
(1) විලනීයතාවය (2) විශිෂ්ඨතාපය (3) ද්‍රවාංකය (4) ස්කන්ධය

(5) යම් ද්‍රව්‍යයකට හෝ උපකරණයකට යොදනු ලබන බාහිර බලය හේතුවෙන් එය කොටස්වලට කැඩී යාම.
(1) විරූපණය වේ. (2) භංගුරතාවය වේ. (3) සුවිකාර්යතාවය වේ. (4) තන්‍යතාවය වේ.

(6) බ්‍රිතාන්‍ය ප්‍රමිතිය අනුව ගඩොලක් දිග, පළල, උස වන්නේ මිලිමීටර,
(1) (220 × 105 × 65) mm (2) (220 × 102.5 × 65) mm
(3) (215 × 102.5 × 65) mm (4) (215 × 105 × 65) mm

(7) 1:1:3 සිමෙන්ති හුණු බදාමය, පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) සිමෙන්ති 01යි. හුණු 01යි. වැලි 03 යි. (2) සිමෙන්ති 01යි. වැලි 01යි. හුණු 03යි.
(3) සිමෙන්ති 01යි. හුණු 01යි. ජලය 03යි. (4) සිමෙන්ති 01යි. ජලය 01යි. හුණු 03යි.

(8) ද්‍රාවීය සිමෙන්ති යනු,
(1) කොන්ක්‍රීට් සඳහා භාවිත කරන ද්‍රව්‍යයකි. (2) සිමෙන්ති ආලේපනයකි.
(3) PVC නළ එළීමේ දී භාවිත කරන ද්‍රව්‍යයකි. (4) ගෙබිම ආලේපනයකි.

(9) දැවයක අඩංගු ජල ප්‍රමාණය ක්‍රමානුකූලව අඩු කර පරිසර ආර්ද්‍රතාවයට සම කිරීම යනු,
(1) දැව වියළීමයි. (2) දැව පරිවර්තනය කිරීමයි.
(3) දැව සංරක්ෂණය කිරීමයි. (4) දැව පදම් කිරීමයි.

(10) යම්කිසි භාරයක් හෝ ආයාසයක් දරා සිටීම සඳහා කොටස් සම්බන්ධ කර සකස් කරනු ලබන එකලසක් හැටුමක් වේ. හැටුමක තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) නම්‍යශීලී බවයි. (2) ස්ථායිතාවයයි. (3) ඇඳුම් දෙන ගතියයි. (4) දෘඩි බවයි.

(11) කිසියම් කාර්යයක් පහසුවෙන් සහ පිරිසිදුවට කිරීමට ඒ සඳහා භාවිත කරන ආවුද මැනවින් මුවහත්ව තබාගත යුතුය. අත් කියතක් මුවහත් තබා ගැනීමේ දී කියත් දතක් පිහිටුවා ගත යුතු කෝණය කුමක් ද?

(1)



(2)



(3)



(4)



(12) බඩගල් බැම්මක ඇති වැස්ම
(1) ගඩොල් 01කි. (2) ගඩොල් 3/4කි. (3) ගඩොල් 1/2 කි. (4) ගඩොල් 1/4කි.

(13) රූපයේ දැක්වෙන දැව මූට්ටුව වන්නේ,
(1) අඩපලු මූට්ටුවයි.
(2) කයිනෝක්කු මූට්ටුවයි.
(3) මුක්කු මූට්ටුවයි.
(4) හේත්තු මූට්ටුවයි.



(14) දැව භාණ්ඩ නිමහම් කිරීමට පෙර සිදුකළ යුතු කාර්යයක් වන්නේ,
(1) දැව පදම් කිරීමයි. (2) පොලිස් ආලේපයයි.
(3) දැව ආරක්ෂක ද්‍රව්‍ය ආලේපයයි. (4) එනමල් තීන්ත ආලේපයයි.

(15) PVC නල භාවිතය ප්‍රචලිත වීම පිළිබඳව පහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ කුමන ප්‍රකාශ යුගලය ද?
A. PVC නළ ගැල්වනයිස් නළවලට වඩා ශක්තිමත් ය.
B. PVC නළ සැහැල්ලු බැවින් භාවිතය පහසු ය.
C. PVC නළවල පොට කැපීම පහසු වේ.
D. PVC නළ සවිකිරීමට විශේෂඥ දැනුමක් අවශ්‍ය නොවේ.
(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා B ය.

(16) රළු සමාහාර පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) 4.8mm දැලකින් හැලූ විට දැලෙහි ඉතිරිවන ඉදිකිරීම් ද්‍රව්‍ය වේ.
(2) 4.8mm දැලකින් හැලූ විට දැලෙන් හැලෙන ඉදිකිරීම් ද්‍රව්‍ය වේ.
(3) 5.8mm දැලකින් හැලූ විට දැලෙහි ඉතිරිවන ඉදිකිරීම් ද්‍රව්‍ය වේ.
(4) 5.8mm දැලකින් හැලූ විට දැලෙන් හැලෙන ඉදිකිරීම් ද්‍රව්‍ය වේ.

(17) ඉදිකිරීම් කර්මාන්තරයේ දී භාවිත වන යකඩ ඇණ, යතුරු තහඩු, ජනෙල් කොකු ආදිය,
(1) නිමහම් ද්‍රව්‍ය වේ. (2) හැටුම් ද්‍රව්‍ය වේ. (3) සවිකුරු ද්‍රව්‍ය වේ. (4) බැඳුම් ද්‍රව්‍ය වේ.

(18) කැපීමේ හා සැහීමේ ආවුද උපකරණ කාණ්ඩයට පමණක් අයත් පිළිතුර වන්නේ,
(1) ඉස්කුරුප්පු නියන, දෙකොන යතුර, රාස්පය, රේගල් නියන
(2) අත් කියත, තහඩු කතුර, පැතලි නියන, විදුලි යත්ත
(3) අත් කියත, අත් අඬුව, තහඩු කතුර, රේගල් නියන
(4) ඉස්කුරුප්පු නියන, දෙකොන් යතුර, අත් අඬුව, ලෝහ කියත

(19) සුබෝපභෝගී පන්තියට අයත් දැව වර්ග තුනක් වන්නේ,
(1) කළුවර, තේක්ක, නැඳුන් (2) හල්මිල්ල, බුරුත, මහෝගනී
(3) කොලොන්, වෙලන්, කොස් (4) පලු, කුඹුක්, සියඹලා

(20) මෙම රූපයේ පෙන්වා ඇත්තේ,
(1) කරාම කෙවෙනියයි. (2) වැලමිට නැම්මයි.
(3) අළුත්වැඩියා කෙවෙනියයි. (4) කපාට කෙවෙනියයි.



(21) ගඩොල් බැම්මක් බැඳීමේ දී පතුලට සමාන්තරව යොදන්නේ,

(1) ආනබාන්දුවයි. (2) මා බාන්දුවයි. (3) හෝණ කුස්තුරයි. (4) සිරස් කුස්තුරයි.

(22) සිමෙන්ති කොන්ක්‍රීටයක වැරගැන්නුම් යෙදීමේ අවශ්‍යතාවය වන්නේ,

(1) සම්පීඩන ප්‍රත්‍යාබල වැඩි කිරීමටයි. (2) ව්‍යාකෘති ප්‍රත්‍යාබල දරා සිටීමටයි.

(3) සුසංහනය (compacting) වැඩි කිරීමටයි. (4) ආතන්‍ය ප්‍රත්‍යාබල (tensile stress) දරා සිටීමටයි.

(23) උළු අස්සකට ඉහළින් ලින්ටලයක් තබන්නේ,

(1) උළු අස්ස පුපුරා යාම වැළැක්වීමට

(2) බිත්තිය පුපුරා යාම වැළැක්වීමට

(3) උළු අස්සට ඉහළින් ඇති බිත්තියේ බර දරා සිටීමට ය.

(4) ලින්ටලයට උඩින් තබන වා කවුළු රඳවා තබා ගැනීමේ පහසුව සඳහා ය.

(24) ගරාජයකට යොදා තිබූ කොන්ක්‍රීට් වහලයක් කලක් ගත වීමේ දී යටි පැත්තෙන් පතුරු ගැලවී කම්බි කුරු මලබැඳී ඇති බව දක්නට ලැබේ නම් එහි දෝෂය විය යුත්තේ,

(1) කොන්ක්‍රීට් වැස්ම ප්‍රමාණවත් නොවීම.

(2) කොන්ක්‍රීට් දැමීමට යොදාගත් ගල් ප්‍රමිතියෙන් තොර වීම.

(3) යොදාගත් වැලි රළු සමාහාරයක් වීම.

(4) කොන්ක්‍රීට් මිශ්‍රණයට යොදාගත් හුණු මිශ්‍රණය ප්‍රමාණවත් නොවීම.

(25) ගෘහස්ථ ජල සැපයුම් පද්ධතියක් ආරම්භයේ දී ළිඳ තුළ සවි කරන්නේ,

(1) නැවතුම් කරාමය (2) පාද කපාටය (3) බෝල කපාටය (4) බෙදාහැරීමේ කරාමය

(26) සවිධි පංචාස්‍රයක අභ්‍යන්තර කෝණයක අගය අංශක,

(1) $108^0$කි. (2) $72^0$කි. (3) $120^0$කි. (4) $180^0$කි.

(27) සිවිල් ඉංජිනේරුමය ඇඳීම් සඳහා භාවිත කරන පරිමාණ කාණ්ඩය,

(1) K 85 යි. (2) K 86 යි. (3) K 87 යි. (4) K 88 යි.

(28) ගෘහස්ථ ජල සැපයුම් පද්ධතියක් ළිඳේ සිට වතුර පොම්පය හරහා ජල ටැංකිය දක්වා ජල නළ එළීමේ දී කිසිවිටකත් යොදා නොගන්නා සවිකුරුවක් වනුයේ,

(1) අළුත්වැඩියා කෙවෙනියයි.

(2) වැළමිට නැම්මයි.

(3) නැම්මයි.

(4) කපාට කෙවෙනියයි.




(29) මෙහි පෙන්වා ඇති නිර්මාණය වනුයේ,

(1) වෘත්තයකට බාහිර ස්පර්ශකයක් ඇඳීමයි.

(2) වෘත්ත ඛණ්ඩයකට අභ්‍යන්තර ස්පර්ශකයක් ඇඳීමයි.

(3) දෙන ලද වෘත්තයක් තුළ සවිධි බහු අස්‍රයක් ඇඳීමයි.

(4) පාදයක දිග දී ඇති විට බහු අස්‍රයක් නිර්මාණයයි.

(30) දැව කඳක හරස්කඩෙහි වාර්ෂික වළලු,

(1) ඉරිමදය වටා චක්‍රාකාරව දක්නට ලැබේ. (2) ඉරිමදයේ සිට පිටපොත්ත දක්වා අරීයව දක්නට ලැබේ.

(3) එලය කොටසේ පමණක් චතුරස්‍රාකාරව දක්නට ලැබේ. (4) ඇතුළු පොත්ත කොටසේ පමණක් දක්නට ලැබේ.

(31) පුළුස්සන ලද සමහර මැටි ගඩොලක ලා දම් පැහැයක් දක්නට ලැබෙන්නේ,

(1) යොදාගත් මැටිවල අධික ලෙස හුණු අඩංගුව තිබීම නිසා ය.

(2) පෝරණු කට වටේ තිබීම හේතුවෙන් වැඩිපුර පිළිස්සීම නිසා ය.

(3) පිළිස්සීමේ දී පෝරණු කටෙන් ඇතින් පිහිටීම නිසා ය.

(4) අමු ගඩොල් පවනේ වියළීමේ දී වර්ෂාවට හසු වීම නිසා ය.

(32) ඔළුගලට අනතුරුව ආනාපියවිල්ලක් ස්ථානගත කරන්නේ,

(1) ප්ලෙමිෂ් බැමී ක්‍රමයේ දී ය. (2) බඩගල් බැමි ක්‍රමයේ දී ය.

(3) ඉංග්‍රීසි බැමි ක්‍රමයේ දී ය. (4) ද්විත්ව ප්ලෙමිෂ් බැමි ක්‍රමයේ දී ය.

(33) ගොඩනැගිල්ලක් මත ක්‍රියා කරන සජීවී භාරයක් නොවන්නේ, කුමක් ද?

(1) වහලය (2) ගෘහ භාණ්ඩ

(3) ගොඩනැගිල්ල භාවිත කරන පුද්ගලයින් (4) ගබඩාකර ඇති භාණ්ඩ

(34) කැටයත්ත රාස්පය, සූරන තහඩුව, වැලි කඩදාසි ආදිය අවශ්‍ය වන්නේ,

(1) පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සඳහා ය. (2) ආලේප කිරීමේ ක්‍රියාවලිය සඳහා ය.

(3) සුමට කිරීමේ ක්‍රියාවලිය සඳහා ය. (4) සංරක්‍ෂණය කිරීමේ ක්‍රියාවලිය සඳහාය.

(35) දැව හෝ ලෝහ අවයව කෝණික හැඩවලට කපා ගැනීම සඳහා භාවිත කළ හැකි සුදුසුම උපකරණය කුමක් ද?

(1) රාමු කියත (Mitre Saw) (2) ඇන්ගල් ග්‍රයින්ඩරය (Angle Grinder)

(3) රවුම් කියත (Circular Saw) (4) යකඩකපන කියත (Hack Saw)

(36) යතුතලයක් මුවහත් කිරීමේ නිවැරැදි ක්‍රියාමාර්ගය මින් කුමක් ද?

(1) යතුතලයේ දෙපැත්තම වතුරගලේ අල්ලා පසුව තෙල්ගලේ ගෑම ය.

(2) යතුතලයේ දෙපැත්තම ගිනිගලේ අල්ලා පසුව තෙල්ගලේ ගෑම ය.

(3) යතුතලයේ පට්ටම පැත්ත වතුරගලේ අල්ලා පසුව තෙල්ගලේ ගෑම ය.

(4) යතුතලයේ පට්ටම පැත්ත ගිණිගලේ අල්ලා පසුව තෙල්ගලේ ගෑම ය.

(37) ''මිනිසුන් උඩ වැඩ'' යන සංඥා පුවරුව පාමුල රළු භූමියක් ඔස්සේ ගමන් කරන පෙදරේරු ශිල්පියකු අනිවාර්යෙන්ම පිළිපැදිය යුතු ආරක්ෂිත ආවරණ මොනවා ද?

(1) ආරක්ෂිත අත් ආවරණ යුගලයක් සහ ඇස් ආවරණයක්

(2) ආරක්ෂිත හිස් ආවරණයක් සහ ආරක්ෂිත පා ආවරණයක්

(3) ආරක්ෂිත හිස් ආවරණයක් සහ කන් ආවරණයක්

(4) ආරක්ෂිත හිස් ආවරණයක් සහ ඇස් ආවරණයක්

(38) පහත සඳහන් ලෝහ අතුරෙන් බලවේග ආවුද සඳහා යොදාගන්නා විදුම්කටු නිෂ්පාදනයේ දී භාවිත නොකරන ලෝහය කුමක් ද?

(1) ටංගස්ටන් කාබයිට් (2) අධිවේග වානේ (3) පිත්තල (4) මෘදු වානේ

(39) ගඩොල් බැම්මක තිරස් බව හා සිරස් බව පරීක්‍ෂා කිරීම සඳහා භාවිත කළ හැකි උපකරණයක් වන්නේ,

(1) මුළු මට්ටමයි. (2) මට්ටම් ලීයයි. (3) ස්ප්‍රීතු ලෙවලය (4) කුස්තානමයි.

(40) හැටුම් සඳහා ලෝහ භාවිතය ජනප්‍රිය වීමට හේතු මොනවා ද?

(1) වඩා ශක්තිමත් වීම.

(2) එකලස් කිරීමේ පහසුව

(3) අවශ්‍යතා අනුව පහසුවෙන් ගලවා ඉවත් කරගත හැකි වීම.

(4) ඉහත සඳහන් සියල්ලම (ල: 1×40= 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණය - II

**නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 02යි.**

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ. ප්‍රශ්න පත්‍රයට මුළු ලකුණු 60කි.**

(01) (1) මහා අක්ෂය 8cm හා සුළු අක්ෂය 5cm ක් ද වන ඉලිප්සය ඔබ ඉගෙනගත් ක්‍රමයක් භාවිතයෙන් අඳින්න. (ලකුණු 15)

(2) මීටර් 10 පළල ද, මීටර් 15 දිග ද වන සෘජුකෝණාස්‍රාකාර ඉඩමක් 1 : 200 පරිමාණයට අඳින්න. (ලකුණු 05)

(02) ඉදිකිරීම් කර්මාන්තයේ නොයෙකුත් අවශ්‍යතා සඳහා දැව වර්ග බහුලව භාවිත කෙරේ.

(1) දැව වල ඇති ස්වාභාවික ගුණාංග හතරක් ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(2) දැව පදම් කරනුයේ දැවවල ඇති තෙතමනය අක්‍රමවත්ව ඉවත් වීම සිදුවන හානි වළක්වාලීමට ය.
දැව පදම් කිරීමේ ප්‍රධාන ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) දැව පදම් කිරීම නිසා ඇතිවන ප්‍රයෝජන දෙකක් ප්‍රකාශ කරන්න. (ලකුණු 02)

(4) ගෘහ භාණ්ඩයක් සෑදීම සඳහා භාවිත කරන ලෑලි යතු ගා සකස් කරගැනීමේ පියවර හතර පිළිවෙළින් නම් කර ඉන් ඕනෑම එකක් විස්තර කරන්න. (ලකුණු 04)

(03) (1) ගොඩනැගිල්ලක බර නොදරන වෙන් කිරීමකට සුදුසු බැම් ක්‍රමය නම් කරන්න. (ලකුණු 01)

(2) එම බැම් ක්‍රමයේ ඉදිරි ආරෝහණයක් ගඩොල් 6ක් දිගට වරිපහක් උසට අඳින්න. (ලකුණු 03)

(3) අති වැස්ම, හොණකුස්තුරය, සිරස්කුස්තුරය, අඳින ලද රූපයේ නම් කරන්න. (ලකුණු 03)

(4) මෙම ගඩොල් බැම්ම කපරාරු කරන ආකාරය පියවර අනුව විස්තර කරන්න. (ලකුණු 03)

(04) දැනට ලෝකයේ ඉදිකිරීම් කර්මාන්තය ඉතා දියුණු වීමට බලපෑ ප්‍රධාන සාධකයක් ලෙස කොන්ක්‍රීට් හැඳින්විය හැකිය.

(1) වැරගැන්වූ කොන්ක්‍රීටයක භාවිතා වන ප්‍රධාන ද්‍රව්‍ය මොනවා ද? (ලකුණු 03)

(2) 1:3:6 (40) කොන්ක්‍රීට් මිශ්‍රණ අනුපාතය භාවිත කරන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(3) කොන්ක්‍රීටයක වැඩ කිරීමේ හැකියාව පරීක්ෂා කරන පරීක්ෂණය නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(05) වැඩ ලෝකය තුළ තාක්‍ෂණයේ දියුණුවත් සමඟ විවිධ ආවුද උපකරණ භාවිතයෙන් ඉවත් වෙමින් නව ආවුද උපකරණ භාවිතයට එකතු වේ.

(1) ඉදිකිරීම් ක්‍ෂේත්‍රය තුළ භාවිතයෙන් ඉවත් වන ආවුද හා උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

(2) භාවිතය අනුව ආවුද හා උපකරණ වර්ග කර ඇත. ඒ අතරින් කාණ්ඩ දෙකක් නම් කර උපකරණ දෙක බැගින් උදාහරණ දෙන්න. (ලකුණු 04)

(3) ආවුද හා උපකරණ ස්නේහනය යනු කුමක් ද? එසේ කිරීමෙන් ලැබෙන වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 04)

(06) මිනිසාගේ මූලික අවශ්‍යතාවලින් එකක් වන්නේ ජලයයි.

(1) ගෘහස්ථ පරිශ්‍ර තුළ ජලය ලබාගන්නා වක්‍ර ක්‍රමය (Indirect System) හා ඍජු ක්‍රමය (Direct System) පැහැදිලි කරන්න. (ලකුණු 02)

(2) ජලය ප්‍රවාහනය සඳහා භාවිත කරන නළ වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

(3) ජල නල කාර්මිකයෙකුට අවශ්‍ය උපකරණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

(4) ජල නල උපාංග දෙකක් වන නැම්ම (Bend) සහ වැලමිට නැම්ම (Elbow) රූප සටහන් ඇඳ වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(07) (1) ගොඩනැගිලි ද්‍රව්‍ය සපයා ගැනීමේ දී පරිසරයට විවිධාකාර හානි සිදුවේ. එසේ සපයා ගැනීමේ දී පරිසරයට වැඩිම හානියක් වන ගොඩනැගිලි ද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 02)

(2) එම එක් එක් ද්‍රව්‍ය සපයා ගැනීමේ දී සිදුවන පාරිසරික හානි වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(3) ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා ආදේශක ද්‍රව්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණය

## පිළිතුරු පත්‍රය

### I පත්‍රය (බහුවරණ)

| | | | |
|---|---|---|---|
| 01. (3) | 11. (1) | 21. (3) | 31. (2) |
| 02. (3) | 12. (3) | 22. (4) | 32. (3) |
| 03. (2) | 13. (1) | 23. (3) | 33. (1) |
| 04. (1) | 14. (3) | 24. (1) | 34. (3) |
| 05. (2) | 15. (4) | 25. (2) | 35. (1) |
| 06. (3) | 16. (1) | 26. (2) | 36. (3) |
| 07. (1) | 17. (3) | 27. (2) | 37. (2) |
| 08. (3) | 18. (2) | 28. (2) | 38. (4) |
| 09. (4) | 19. (2) | 29. (3) | 39. (3) |
| 10. (2) | 20. (4) | 30. (1) | 40. (4) |

(ලකුණු 1 × 40 = 40)

### II පත්‍රය

(01) (1) මහා අක්ෂය නිර්මාණයට (ලකුණු 02)
සුළු අක්ෂය නිර්මාණයට (ලකුණු 02)
නිවැරැදි ක්‍රමයන් භාවිතය හා
නිර්මාණයට (ලකුණු 04)
වක්‍රය නිදහස් අතින් නිර්මාණයට (ලකුණු 04)
පිරිසිදු බවට (ලකුණු 03)
(2) නිවැරැදිව පරිමාණ ගත කර ඇත්නම් ලකුණු 05

(02) (1) ශක්තිය, කල්පැවැත්ම, දෘඩි බව, අලංකාරය, සිත් ඇදගැනීමේ සුළු බව, කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව (හතරම ලියා ඇත්නම් ලකුණු 2 ද, දෙකක් ලියා ඇත්නම් ලකුණු 01ද දෙන්න.)
(2) ● ස්වභාවිකව පදම් කිරීම
● පෝරණුවේ පදම් කිරීම
● මිශ්‍ර පදම් කිරීම. (ලකුණු 02)
(3) නිවැරැදි පිළිතුරු 01ට එක බැගින් ලකුණු 2යි.
(4) නිවැරැදිව පියවර නම් කිරීම ලකුණු 03යි.
විස්තර කිරීමට ලකුණු 01යි.

(03) (1) බඩගල් බැම්ම (ලකුණු 1)
(2) නිවැරැදිව ඇඳ ඇත්නම් (ලකුණු 03)
(3) නිවැරැදි නම් කිරීම් 1ක් සඳහා 1 බැගින් ලකුණු 03
(4) නිවැරැදි පියවර අනුව (ලකුණු 03)

(04) (1) සිමෙන්ති, වැලි, කොන්ක්‍රීට් ගල්, වානේ කම්බි, ජලය (තුනක් සඳහා ලකුණු 03යි.)
(2) ගෙබිම ඇතිරීම, අත්තිවාරම් පතුල, ඇතුරුම් පුවරු (ලකුණු 1 × 3 = 03)
(3) බැහුම් පරීක්ෂාව නම් කිරීමට ලකුණු 01ක් ද, විස්තරයට ලකුණු 03ක් දෙන්න.

(05) (1) අවගාරය, දුනු කියත, බුරුමය, යතු වර්ග, තහඩු කියත හතරම ලියා ඇත්නම් ලකුණු 02ක් ද, දෙකක් ලියා ඇත්නම් ලකුණු 01ක් ද දෙන්න.
(2) ඕනෑම භාණ්ඩ දෙකක් හා උදාහරණ ලියා ඇත්නම් ලකුණු 04යි.
(3) ස්නේහනය හැඳින්වීමට ලකුණු 02ක් ද, වාසි දෙකකට වඩා ලියා ඇත්නම් ලකුණු 02ක් දෙන්න.

(06) (1) නිවැරැදි පැහැදිලි කිරීමකට (ලකුණු 02)
(2) upvc, තඹ, වීනට්වට්ටි, cpvc, Gpvc(ලකුණු 02)
(3) නලරීමරය, නල ප්‍රකුංචය, යකඩ කපන කියත ධමනි පහන (ලකුණු 02)
(4) රූප සටහන් 02ට ලකුණු 02ද වෙනස පැහැදිලි කිරීමට 02ක් ද දෙන්න.

(07) (1) වැලි, ගඩොල්, දැව
තුනම ලියා ඇත්නම් ලකුණු දෙකයි.
දෙකක් ලියා ඇත්නම් ලකුණු 01යි.
(2) නිවැරැදි පැහැදිලි කිරීම් සඳහා ලකුණු 04යි.
(3) ගඩොල් - බ්ලොක් ගල් / සිමෙන්ති මිශ්‍ර මැටිගල්
දැව - ඇලුමිනියම්, යකඩ, ප්ලාස්ටික්, වීදුරු
වැලි - ගල්කුඩු, පැරණි ගොඩනැගිලි ඉවත් කිරීමෙන් අඹරාගත් කොටස්, මුහුදු වැලි
මැටි උළු - ඇස්බැස්ටෝස්, GI තහඩු, සිමෙන්ති ඈ
එකකට එක බැගින් නම් කර ඇත්නම් 01 බැගින් ලකුණු හතරම දෙන්න.